2020.03.31 න් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු සීමිත අරලිය පොදු සමාගමට අදාළ වේ.

| | රු. '000 |
|---|---|
| විකුණුම් | 2400 |
| විකුණුම් පිරිවැය | 1200 |
| මෙහෙයුම් වියදම් | 600 |
| යන්ත්‍ර විකුණුම් ලාභ | 160 |

| | |
|---|---|
| සාමාන්‍ය කොටස් හිමියන්ට ගෙවූ අතුරු ලාභාංශ | 200 |
| ප්‍රත්‍යාගණන හිඟය - මෝටර් රථ | 240 |
| ප්‍රත්‍යාගණන අතිරික්තය - ඉඩම් | 360 |

2019.03.31 න් අවසන් වර්ෂය සඳහා මෝටර් රථ ප්‍රත්‍යාගණනය මත රු. 180,000 ක අතිරික්තයක් හඳුනාගෙන තිබුණි. 2020.03.31 අවසන් වර්ෂය තුළදී ප්‍රථම වතාවට ඉඩම් ප්‍රත්‍යාගණනය කර ඇත.

LKAS 01 ට අනුව 2020.03.31 න් අවසන් වර්ෂය සඳහා හඳුනාගත යුතු මුළු ආදායම හා මුළු වියදම කොපමණ ද?

❖ **පිළිතුර**

මුළු ආදායම → අයභාරය | ලාභ

විකුණුම් 2400 යන්ත්‍ර විකුණුම් ලාභ 160

ඉඩ.ප්‍රත්‍යාග අතිරි. 360

= 2400 + 520

= 2920

මුළු වියදම → වියදම් | අලාභ

විකු. පිරි. 1200 මෝ.රථ.ප්‍රත්‍යා.හිඟ240

මෙහෙයුම් වියදම් 600

1800 + 240

2040


Copyright © www.e-thaksalawa.moe.gov.lk

ලාභ හෝ අලාභ හා වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය තුළින් කාලච්ඡේදයේ මුළු විස්තීරණ ආදායම නිරූපණය කරයි.

LKAS 01 ට අනුව මුළු විස්තීරණ ආදායම පහත පරිදි නිර්වචනය කළ හැක.

''අයිතිකරුවන් වශයෙන් ඔවුන් සමඟ කරනු ලබන ගණුදෙණු වල ප්‍රතිඵල හැර අනෙකුත් ගණුදෙණු හා සිද්ධීන් වල ප්‍රතිඵලයක් සේ කිසියම් කාලච්ඡේදයක් තුළ දී හිමිකමේ (ස්කන්ධයේ) ඇතිවන වෙනස්වීම''.

**මුළු විස්තීරණ ආදායම = කාලච්ඡේදයේ ලාභ / (අලාභ) + වෙනත් විස්තීරණ ආදායම**

➢ <u>වැදගත් :</u>

- අයිතිකරුවන්ට සිදුකරන බෙදාහැරීම් හා අයිතිකරුවන්ගේ දායකත්වයෙන් තොරව හිමිකමේ සිදුවන වැඩිවීම මුළු විස්තීරණ ආදායම වේ.
- මෙහිදී සියලු ආදායම් (අයභාරය, ලාභ) හා සියලු වියදම් (වියදම් , පාඩු) අදාළ කරගත යුතුයි. ඒ අනුව කාලච්ඡේදයේ හඳුනාගත් මුළු ආදායම වියදම අතර වෙනස මුළු විස්තීරණ ආදායම වේ.
- මුළු විස්තීරණ ආදායම ගණනයේ දී කාලච්ඡේදයේ ලාභයට වෙනත් විස්තීරණ ආදායම් එකතු කළ යුතුයි.

අන්තර්ගතය : බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
සැකසුම : ජී.කේ.එස්.ඩී ජයරත්න, හ/ වීරකැටිය රාජපක්ෂ මධ්‍ය විද්‍යාලය - වීරකැටිය
Copyright © www.e-thaksalawa.moe.gov.lk